මගේ අංකය:ජේඑස්සී/ඊඒ/ස්ථානමාරු/2025

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

**<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ)<br>වාර්ෂික ස්ථානමාරු - 2025</u>**

මගේ සමාංක සහ 2024.11.27 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උක්ත ස්ථාන මාරු නියෝගය හා බැඳේ.

02. එහි සඳහන් උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ) වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මකවීමේ දිනය, අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය පරිදි (ස්ථානමාරු අභියාචනාවලට යටත්ව) **2025.02.03** දින ලෙස සංශෝධනය කරනු ලැබේ.

03. ඒ අනුව 2024.12.27, 2024.12.30, 2025.01.02, 2025.01.03 සහ 2025.01.20 දින දක්වා තම නිත්‍ය සේවා ස්ථානයෙන් වෙනත් අධිකරණ වෙත තාවකාලිකව අනුයුක්ත කරනු ලැබූ සියලු නිලධාරීන්ගේ අනුයුක්ත කාලය, **2025.01.24** දින දක්වා මෙයින් දීර්ඝ කරනු ලැබේ.

04. තව ද ස්වකීය ස්ථිර සේවා ස්ථානයෙන් වෙනත් අධිකරණ වෙත "තාවකාලිකව" ස්ථානමාරු කර 2024.12.30 දිනෙන් අවසන් වීමට නියමිතව තිබූ සියලු නිලධාරීන්ගේ "තාවකාලික" ස්ථානමාරු අවසන්වීමේ දිනය **2025.01.24 දින** ලෙසට මෙයින් සංශෝධනය කරනු ලැබේ.

05. ඉහත 03 සහ 04 ඡේදවල සඳහන් නිලධාරීන් 2025.01.27 දිනට තම නිත්‍ය සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකිවන පරිදි 2025.01.24 දින සේවයෙන් පසු මුදාහැරීමට කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 දෙසැම්බර් මස 23 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.